# ලන්ඩන් කවි
## LONDON KAVI

2 Queens Parade, Green Lanes, London, N8 0RD
Tel: 020 8347 6151, Fax: 020 8348 0660, Email: kavi@londonkavi.com
Free Circulation - Vol 1 Issue 4 March - April 2004


## ආරච්චි රාල

අලියා වැටුණු වැව ආරච්චි රාල    ට
මුව මස් ඌරු මස් හිඟ නොමැත කැම    ට
මුළු ගං ගොඩ ම හිටියත් ඔහු ගෙ වාල    ට
ඔහු වැඩිපුර-ම බය ලොකු සයිබු නාන    ට

වට්ටක්කා වැලකි ඒ ගෙයි වහල ම    ත
එරඬු වැටේ වැඩිපුර ලොකු කපොලු නැ    ත
කුරහන් බිස්ස යට බල්ලට සෙවණ ඇ    ත
ඔහු ගේ ගෙදර මට හොඳට ම මතක ඇ    ත

පස් බානක් ම ඔහු හට හොර හරක්    ඇත
ගමනට පැදුරු ඇමූ බර බාගයක්    ඇත
නියඟයක් ආවත් ඉන් වැඩිපුර බයක්    නැත
වැව කිට්ටුවට වෙල 'ඉස්සර' හයක්    ඇත

ඉදිකඩ ළඟ ම සිට ගත් මහලු පලු    ගසේ
පොඩි පෙට්ටියක පානට මැසි පොකුරු    නැසේ
එළියක් දුටිමි ඒ එළියෙන් ඔහු ගෙ    හිසේ
මට මේ ලියන විට තව ඒ එළිය    දිසේ

රජයේ සේවයෙන් කෙහෙ පැදුණු ත    ට්ටේ
පොල් තෙල් ගෑ වැනිය අමු පොලයක ක    ට්ටේ
නැවරුණ බවක් පවසන ගොම මුසු මැ    ට්ටේ
කොණ්ඩය කුහුඹු ගුළියකි පොලයක නැ    ට්ටේ

කෙස් නැති හිසට නැඟ ගන්නට බලන    මෙනී
කම්මුල දෙසට රළු උඩු රැවුල කැරකු    ණී
හතරට බිඳුණු බැම රළු ලොම් ගන ව ග    නී
අලියා වැටුණු වැව මේ හැම ලකුණු ද    නී

රජයේ සේවයට දිවි කැප කරන    මෙනී
රෑ දාවලේ යයි ගං ගොඩ දෙසට වැ    නී
කන බොන වෙලාවට අඹුවට හොඳට බ    නී
අලියා වැටුණු වැව මේ හැම ලකුණු ද    නී

වී බුසලකට සිතුවොත් කුඹුරකුදු    ගනී
රුපියල් දෙකක් දෙන විට පස් වරක්    ගනී
සමහර විට දි ඉදිකඩ වැට උඩින්    පනී
අලියා වැටුණු වැව මේ හැම ලකුණු    දනී



**කුමරුට කොකා පෙන්වන පිය සොඳුරු    ළඳේ**
**මව් නැති පුතුට දුක්ගිනි නොම දෙවන්    සොඳේ**
**අමතක වෙලා ලොව මිතුරන් සමඟ    කඳේ**
**'බොනවද කිතුල් මුල හිඳ කිරි' කුමරු    සඳේ**

(හැරී කුමරු අලුයම තුනට පමණ රාත්‍රි සමාජ ශාලාවකට ගොඩ විය.
ඒ ඡායාරූප ශිල්පීන් නිදාගන්නා වේලාව නම් නො වේ.)

---

මුළු රෑ ලැගී හිඳ පලු ගහක    මැස්සක
ලැබගෙන අහිංසකයෙකු පිදුව    මස්ටික
වළඳා අදට වූවත් වසර    විස්සක
පුදුමයි බලන්නට අද ඔහුගෙ    රැස්ටික

කිසිවෙක් නො වේ කෙරුමට මොහු සමග    හබේ
වෙහෙසක් නැතිව යල මහ අස්වනු ද    ලැබේ
කුරහන් වියෙන් බිහි තුන ඉදිමුණ ද    ඉබේ
යම්කිසි බියක් ඔහුගේ නෙත් අතර    තිබේ

දවසින් දවස වන පෙත ගංගොඩෙහි    හැපේ
ඔහුගේ ගෙදර ළඟ කළුවර බුරුත    කැපේ
ගැමියන් පිහිට ලැබ ගිනි ඇවිළුණ ද    ලිපේ
හැම ගැමියෙක් ම ඔහුගේ පා මුලෙහි    හැපේ

විමලරත්න කුමාරගම

(7 වැනි පිට බලන්න)

## පැරිස් පුරට ආ යුවලක් මෙසේ සිතු වගයි

හිම පියලි වැහි වහිනවා ගන අන්දකාරේ
එහි මහිම බලන් මා පියාදර සොඳුරියේ
නිශාචර නාඩගම් රූ රඟන පැරිස් අග නගරේ
අර බලන් යැයි ඔබ නුවන් එහි කෙසේ රඳවම් ද සොඳුරේ

මවුබිමේ කල් ගෙවූ අතීත සොඳුරු මිහිරේ
වසත් කල දසත රැන්දූ පියුම් මකරන්දේ
ඇනුදු සුවඳයි නෙළුම් පිපී ඔබ ගෙ දෙකොපුල් විලේ
අපි සැණින් ඉගිල යමු වසන්නට ඒ පුණ්‍ය භූමියේ

සිත හිම කළ ඉපල් ගස් වැටි ඉතිරේ
අසිරිමත් වූ මේ නගරයේ දෙවුරේ
අපි නුවන් රන් දොරටු වසා ගමු සොඳුරේ
දකින්නට පෙර ඒ නුවර සලෙල දන සංසාරේ

තුන් කල් ම මනකල් අප ස්වර්ණ භූමියේ
වසන්නට වාසනා නොලැබ ඇයි ද දීපංකරේ
අපි සැණින් ඉගිල යමු එහි ස්වර්ණ මාලියේ

*කෝ ආනන්ද - පැරිසිය*

## The Carnival of Youth

There was a carnival
Where we all enjoyed
We were the fun makers
We were the fun takers

Colourful flashes
Music and the dancing floors
And merry - go - rounds

Nòbody noticed
The clock of reality
Kept on passing.......
Then it was time
For us to leave the carnival

We kissed each other
And whished each other
Got their bags
along their own paths

Somebody must be there
To clean the place
Where the carnival was

Everybody left
With out stopping even a second
To see the empty ground of the carnival

I was left to clean it all
What a joyfull carnival
What a fate...... oh......
What a fate?

**Swarna Herath**
**Enfield**

## කාලගුණ රකුස්

හිමත් කළ ගෙවී
යතැයි තුටු වෙවී
දිනිඳු පිබිදෙමින්
නඟන හස කැලුම්

තුරු ද රැවටෙමින්
ලපළු පුබුදතී
මල් ද පෙති විදා
සුවඳ වගුරතී

සුමුදු නල සෙමින්
සුවඳ රැගෙන යත්
නවමු තනු සදා
විහග කැල වයත්

නමුදු මොහොතකින්
අරුම වෙනසකී
සුළඟ සැඩ වෙමින්
ලොව ම කළඹතී

කාලගුණ රකුස්
රැගෙන නොයෙක වෙස්
පතුරුවන විපත්
කෙදින නතර වෙත්

*සේපාලිකා ජයසිංහ*
*මිඩ්ල්සෙක්ස්*

## ගං වතුර ඇවිත්......!

සුළඟ ඔහේ හමාගෙන එන්න
වැහි වලාවක් ම ගෙන එන්න

ගස් යට වැහි දෙකක් කරන
පාර දිගේ මඩ පුම්බන
හබරල කුඩ ඉහට නඟන
මොසම් වැහි හිසින් රැගෙන

සුළඟ, ඔහේ හමාගෙන එන්න......!

වැහි දියෙන් මොලපු ඔය පිරේවී
මැටුවල් වෙලත් උතුරා ගලාවී

සරමත් පට පිටට ම යන
කෙහෙල් කොටන් පාරු තැනෙන
බිලී පිතිත් ඇතෙ රඳන
මඟුරු රැන් ගොඩට අදින

රතට රතේ දුවන පනින
ලුල් පිලා රංචු ගැහෙන
මොලපු ඔයට අප කැන්දන
දුව දුව යන වැහි අරගෙන

සුළඟ ඔහේ හමාගෙන එන්න......!

කිරළානෝ ඉඳුණු කිරල
කදුරු වැටිය ළඟට ගෙනෙන
ඔය ඇලේ කොරලි පැටව්
ඕවිට අද්දරට පනින
වාන් දමා මායම් කළ
ඔයත් වෙලත් හාමු කරන

මහ වැස්සක් හිසින් රැගෙන
සුළඟ, ඔහේ හමාගෙන එන්න......!

කොරවක්කන් මොර ගස්සන
සේර පැටව් බොරල් ගනින
ඉඳුරු ගාල බය කර ගෙන
කැරන් දලුත් උඩට නැගෙන

දෙවියෝ උඩ බෝල ගහන
කණට වැටෙන අකුණු වදින
බොරලු වගේ වතුර වැටෙන
මහ වැස්සක් ඔසවා ගෙන

සුළඟ, ඔහේ හමාගෙන එන්න.....!

තොටගමු විහාරේ ඇන
අපේ පිනට ම පැමිණුන
නාථ දෙව් රජා නෙන
මෙ දුක් දුරු කරනු මැන

පාළුවු නිල් අහස වසා ගෙන
රුදුරු ගං වතුර බිය නසා ගෙන
ඔයබඩ ජීවිතේ ගරුසරු කරන
සුළඟ, වැහි වලා අරන් වඩිනු මැන......!

*උදය නන්දන වීරරත්න*
*ලන්ඩනය*

## හඳපානයි ජීවිතයි

සුදු මීදුම් සළු පැළඳු කඳු යායට උඩින්
සඳ හිනැහී එබී බලයි පුරුදු මිතුරු වෙසින්
ගලා හැළෙන රැස් රේඛා අතු ඉති තෙලි තුඩින්
නිල් තණ මත නෙක සිතුවම් රටා අඳියි සෙමින්

සඳ ඇවිදියි යන යන තැන මා හා තනිවට
වග තුග විමසයි සපැමිණ මගෙ හද කුටියට
මිතුරු සබඳ දුක් ගන්නේ ඇයි ඔබ මෙලෙසට
හිත සනසනා කවිකම ඇත මා ළඟ තනියට

සඳ සිසිලේ මිහිර විඳින සිත් ආකාසෙට
මතක පොතේ නෙක සිතුවම් පාවෙයි හෙමිහිට
දුක් සංකා මුසු වී යයි සඳ දිය වතුරට
විකසිත වන නැවුම් හැඟුම් සුවදෙයි සිතකට

ගිරිහෙල් මැද දිවි තවලම හැල්මේ යනවිට
මුදු සිහිලැති හඳපානත් රුකුලකි දිවියට
මුදා හරිමි දිවි සරතැස සුදු සඳ එළියට
නව හුස්මක් ලැබේ නැවත මේ දිවි ගමනට

අවපස යයි හෙමින් සැරේ අඩු වී යන සඳ
අමාවකට කළුවර දී සැඟවී යන සඳ
පුරපස වී මිහිකත මුව සිප සනසන සඳ
නිල් අහසත් අත ළඟමැයි සිතේවි සකි සඳ

*පද්මා කුරුප්පු - පැරීසිය*



## ලන්ඩනයේ මා දුටු ළඳ

අලංකාර හැඩ රුව ඇති ඇගෙ දේහය කලාවක්ය
උපමාවක් කියතොත් එය සිත්තරකු ගෙ සිත්තමක්ය
කළු මුහුණේ අගය පෙනෙන සිනහ රැල්ල ඉනාවක්ය
ලන්ඩනයේ මා දුටු ළඳ ලංකාවේ තරුණියක්ය

ලැසි ගමනින් මේ තරුණිය තම පාඩුවෙ හැම වෙලාවෙ
උදේ හවස වැඩට යන්නෙ දිවි රැකුමට හුද කලාවෙ
යන එන මඟ නොවී පමා නොවැටෙන්නට මං මුලාවෙ
ඇය ගෙදරින් පිට වෙයි හඬ ඇසුණ ම ටැක්සියෙ නළාවෙ

සැඩ සුළඟට කැඩුණ නිසා ඇය නෙත යන කුඩය පොඩිය
සීතලයේ ඇය ගැහි ගැහී අහිංසකව තබයි අඩිය
දහසක් දන පසු කර යයි ඇය ගැන සැලකුමක් නැතිය
ඇයටත් දැන් වැටහී ගොස් බටහිර තිරිසන්නු ගතිය

විලිබිය සැක සංකා නැහැ බටහිර මිනිහ ගෙ ඔළුවෙ
දුටු දුටු කත හා එක්වී අම පහසයි ඔහු පැතුවේ
දුසිරිතයෙන් හැම මොහොතෙ පිරිහෙන විදෙසක මෙලොවේ
පෙර කල පවටයි කෙල්ලේ ඔබ මෙහි එන්නට සිතුවේ

රෝස කුසුම පෙති විහිදා සුවඳ හමන විට අගේද
උල් කටු දස අත නැගෙන්නෙ රැකවරණයකට වගේද
මල තළන්න පැණි උරන්න බමරුන් එන්නේ ඉබේද
අද හෝ හෙට මල පර වී දුක දොම්නස ඉන් නැගේද

*තිලක් එස්. ප්‍රනාන්දු - ලන්ඩනය*

## සීපද

කවදා නමුත් නුඹෙ සවනට ඇසෙන්න ට
මට හිතෙනවා සිව් පදයක් කියන්න ට
සංසාරෙට ම සෙවණැල්ලක් සේ ඉන්ට
හීනෙන් තවත් එක දවසක් පෙනෙන් මට

අවුල් ජාලයක පැටලී සිටින විට
දුක් දොම්නසින් ජීවිතය ම පිරෙන විට
මිතුරු තුමන් පිටු පාමින් වඩින විට
නුඹ ගැන සිතීමත් මහ සම්පතකි මට

තුරුලිය කහ ගැහී පත් බිම හෙන්නේය
සීත සමය නැවතත් එළඹෙන්නේය
ඉන්පසු වසන්තයෙ මල් හටගන්නේය
සුවඳ විඳින්නට පෙර පරවන්නේය

කාලිදාස මෙන් මහකවි ලියන්නට
රාහුල සමිඳු මෙන් ලිය රූ වනන්නට
සේකර වගේ රසබර ගී ලියන්නට
නෙතග බැලුම් මතු දවසෙත් දියන් මට

මහ වැස්සේ එළිමහනේ ඉන්න එපා
ගිනි අව්වේ තනි පාරේ යන්න එපා
රෑ මැදියමේ නිදිමර මර ඉන්න එපා
මා මඟ හැර පිට පාරේ යන්න එපා

*උදය ප්‍රශාන්ත මැද්දෙගම*
SOAS - Univessith of London

## Snake Attack

The snake slithers to wards its prey,
On a gentle balmy day,
The black diamond-shaped eyes
Are glued to the mouse,
Like a sniper that aims at a house,
Winding itself like a spring,
Ready to dart through the air
Like a bird on the wing,

The fangs pierce in to its lunch,
The little mouse didn't even have a hunch,
It took one breath and then it was dead,
Lying still on a soft leafy bed

**By**
**Osajie Oboh (10 years old)**

## සමනළ වන්දනාව

| | |
|---|---|
| සුසිනිඳු සුනිල් අඹරෙහි සුදු වලා | මැද |
| බැබළුණ පසු ව පායා පුන් නවම් | සඳ |
| සම්බුදු සමිඳු ගේ ගුණයෙන් සිත | පෑද |
| බුදු පා වැඳ ගතිම් සිරිපා මළුව | මැද |
| ඈත හිම වතෙහි පැතිරී යන | අයුරෑ |
| සැදැහැතියන් ගයයි බුදු ගුණ ගී | මියුරෑ |
| සිරිස නමා වැඳ වැඳ දම්කඳ | සයුරෑ |
| සිරිපද හමුවෙ දකිනෙම් බුදු රුව | මහරූ |
| සීතල හිමිදිරියෙ මනසට සුවය | දිදී |
| රිවි දෙව් පැමිණ තෙවරක් පා කමල | වදී |
| දොළොස් මහ පහනෙ සිළුවට සුළං | වැදී |
| අටලෝ දහම ගැන සිතුමට වරම් | යදී |
| පතල මහා කරුණා ගුණ ලයෙහි | පිරී |
| අවිදු අඳුර පහදා දුන් මුවෙහි | සිරී |
| දුෂ්කර මඟ ගෙවා සපැමිණ දුකෙහි | එරී |
| බැතිබර දනෝ උඩ මළුවෙහි ගිමන් | හරී |
| සසර විඳින දුක් කඳ මහ හිමය | මෙනි |
| එතෙර දකින මඟ හෙළි කළ සුගත | මුනි |
| සිරිපා පියුම වැඳ අප හද තුළ දවන | ගිනි |
| සුළඟට විසි කරමු ලැබගෙන අමා | පැණි |

*ජේනට් සුභාවික්‍රම - ගම්පහ*

## හිම කුමරි

සිසිල් සුළං හමා යයි දසත පුරා
නොදැනේ සිටිය දී වීදුරු කුඩුවක් තුළ
පැමිණි විට එළි පහලියට
දැනෙයි හිරිගඩු පිපෙන සීතල

දුටු විට කොළ සිඳී ගිය තුරු ලතා
දැනේ මහා පරාජිත බවක් හදවතට
පැතිර ඇත මූසල අඳුරක් අහස පුරා
විහිදේ මඳ කරුවලක් දසත

තොර තෝංචියක් නැතිව ඇදෙන වාහන පෙළ
අඳුරු බව වැඩි කරයි පරිසරය පුරා
පෙනේ ඇදෙනා හිමැති දැ දෙකඩ කර අඳුර

නොවැටුණ ද තද හිම
දුටිමි
හිම පැහැ තොප්පිය සමඟ ඇය
කුමරිය මතක් විය
හිම දුටු විට ඇගේ සුසුදු වත

නෙතට රසඳුනකි දුටු
ඒ රුව පාළු මූසල
යාමයක අඳුරු
සිනාසුණි කුමරිය මා හා
නෙතඟින් දයාබර ලෙස

*ප්‍රසංග සමරවීර - සවුත්ගේට්*

# අම්මා

ඔබෙ ජීවන සුවඳ දැනේ අම්මේ
ඔබෙ ඇඳුම්වල
සුවඳ තාම තියේ අම්මේ

ලන්ඩන් එන්න පෙරදින දී
ඔබ තුරුලේ හිඳ
මා ඇඬුවා අම්මේ
මගෙ දිවියට සුබ පතලා
සැනසුවා ඔබ අම්මේ

ම පියා හා
ජීවිතයේ දුක් සැප දෙක
බෙදාගත්ත අම්මේ

ඔහු මිය යන්නට පෙර
මිය යන්නට 'පැතුව' ද ඔබ
ජීවත් වූ විදියට ඔබ අම්මේ

ඔහු හට දින තුනක් කලින්
අප හැර ගොස්
දින තුනකට පසු ආ ඔබ
පෙරුම් පුරා තිබූ අයුරින්
ඔහු හා එක්වී සතුටෙන්
තුසිත පුරේ දෙව් ලොව
වැඩිය ද මගෙ අම්මේ

දින සති මාසෙට හැරුණත්
දුක් සිතිවිලි අඩුවක් නැහැ
අක්කා හා එක් වී මම
නිති අඩනව අම්මේ

ඔබ කිව් ලෙස සොයුරු පෙමින්
දුක සැප එක ලෙස විඳිමින්
අක්කා මා ගැන බලමින්
ඔබේ අඩුව
පුරවනවා අම්මේ

මේ සසරේ ඇවිදින තෙක්
අපේ පියා සමඟින් ඔබ
අපේ ම මව් වන්නට යැයි
පතනව අපි අම්මේ

මෙතේ බුදුන් දැක සැනසී
නිවන් යන්න අම්මේ

*සෞමි සෙල්වරන්ජන්*
ලන්ඩනය


සංස්කාරක - අනුර හැගොඩ
**Editor -** Anura Hegoda
සංස්කරණ සහය - යසිරු සමරකෝන්
මලිත් හැගොඩ
අනෝමලී - අනුත්තරා
**Editorial - Assistance** Yasiru Samarakoon
Malith Hegoda
Anomali - Anuthara
වෙබ් අඩවි නිපැයුම - කසුන් පලන්සූරිය
**Web Design** - Kasun Palansuriya

# ශෆීලියාගේ ඉරණම



මැන්චෙස්ටර් ප්‍රදේශයේ ඉන්දියානුවන් බහුල පෙදෙසක පකිස්ථාන දෙමාපියනට දා ව ඉපැදුණු ශෆීලියා ගෙදර දී තම පකිස්ථාන සංස්කෘතියත් සමාජයේ දී එංගලන්ත සංස්කෘතියත් අතර ඉමහත් අරගලයක යෙදුණා ය. දහසය හැවිරිදි පාසල් සමයේ සිටි ඇය පකිස්ථානයේ නෑදෑ තරුණයෙකුට විවාහ කරදීම සඳහා දෙමාපියන් කළ උත්සාහය ප්‍රතික්ෂේප කළ ඇය සිය දිවි නසාගැනීම සඳහා විශබීජ නාශකයක් බීවා ය. එයින් බේරුණු ඇය පසුගිය දෙසැම්බර් මස හිටි හැටියේ නිවසින් අතුරුදන් වූවා ය. ශෆීලියා විසින් සංස්කෘතික සට්ටනය පිළිබඳ ව ලියන ලද කවි කීපයක් ඇය මියගිය පසු ඇගේ දිනපොතේ තිබී හමු විය. මෙහි පළ වන්නේ එයයි. පෙබරවාරි මාසයේ දී ගං ඉවුරකට ගොඩගසා තිබූ ඇගේ මළ සිරුර හමු විය. මරණය පිළිබඳ ව සැකපිට පොලිස් අත්අඩංගුවේ දෙමාපියන් පසුවෙති.

## Happy Families


I don't pretend like we're the perfect
family on more
Desire to live is burning
My stomach is turning
But all they think about is honour
I was like a normal teenage kid
Didn't ask 2 much
I just wanted to fit in
But my culture was different
But my family ignored

I lay in bed hoping the next day would
be better
It was just a thought
Because it never happened no
But still I dream of this today yeah hey
I wish my parents would be proud of
wot I done
Instead it's you've bought shame
Or something else lame
I don't wanna hear this no more
No no no

## Trapped

It was my last year in school, so happy
with my friends I got lots to do
But came this day when everything
changed
I came home it seemed like a normal day
But somthing wasn't right
I wish I coulda changed the event
I shoulda killed myself instead
I'd rather have been dead
Coz now I have a burden on my chest
And no it won't go away, the guilt,
the pain

*Chorus*
*I feel trapped so trapped, I'm trapped*




තමන් ගෙ ජාතියට කොකා
පෙන්වන ජාතියෙ ම එකා
උගෙ ලොකුකම් ගැන නොතකා
දුටු දුටු තැන දමනු මකා

පන්දම් අල්ලන්නෙ පෙන්දන්
තැන තැන ඉන්නෙ
කොන්ද තියෙන සිංහලයින්
උන් අඳුනන්නෙ

ඒදණ්ඩක යන්නට බැරි
පණ්ඩිත මුත්තන් ගෙ
ගොන් පස් අල්ලන හිවලුන්
තැන තැන වැජඹෙන්නෙ

පුරසස්ති ගයන්නෙ
උන් ගෙ කුණු හෝදන්නෙ
හාල් පාරු තක්කඩියන්
හඳුනා ගන්නෙ

රටේ උතුම් ආසනවල
දැන් දැන් ඉඳගන්නෙ
විදේශින් ගෙ අත නැටවෙන
සිහල පඹයි වෙන්නෙ

පඹයි රඟන්නෙ
නූලෙන් වැඩේ කෙරෙන්නෙ
පඹයි දොඩන්නෙ
පක්සෙන් කට හඬ දෙන්නෙ

*සුගත් සමරකෝන්*

පසුගිය දා ලන්ඩනයේ දී දොරට වැඩි සුගත් සමරකෝන්ගේ 'කඩු පන්හිඳ' කැසට් පටයෙන් උපුටාගත්තක්.

# මිතුරියන්ට......

මලින් බර ව
රුවින් රුවට
සුවඳ විදා - වර්ණ දරා
උදාව එයි
වසත් සමය

මල් මැළ වී
රුව විසිරෙයි
හිම සීතල - හරි කටුකයි
උදාව එයි
සීත සමය

නුඹ සිහි වෙයි
එවන් කලට
මගේ සතුට බෙදාගන්න......

නුඹ සිහි වෙයි එවන් කලට
මගෙ දුකේ දී ළඟ ම හිටිය

*ස්වර්ණා හේරත් - එන්ෆීල්ඩ්*

---

## ගජමන් නෝනා විසින් රචිත කාව්‍ය ගර්භ කොෂටයක්

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ස | ත ර | ස | ර ස | ස | ල ර | ස |
| ඳ | | ණ | | ක | | ර |
| ස | | නැ | | ස | | ල |
| එ | ත ර | ක | ත එ | ස | ය ර | ස |
| උ | | ල | | ව | | ස |
| ණ | | ම | | න | | ඳ |
| ග | ඹ ර | ල | ක ඹ | ර | ස ර | ස |
| ර | | ත | | ද | | ත |
| ව | | ර | | ල | | ඳ |
| එ | ත ර | ක | ළ ද | ල | ය ර | ස |

සතර සර සසල රස
පතර කත එසය රස
ගඹර ලකඹර ස රස
පතර කළ දළය රස

පවර ගණ උප සඳ ස
කරතල මලක නැණ ස
ලලදර නවස සම ස
සඳ සඳ සසල ර ස

## හැරදා ගිය පෙම්වතියට

මතු දා සිට ම ඔබ ළඟ තුරුලෙ වැද
මිහිරෙන් මත් කෙරුව මගෙ මේ තුරුණු හද
මිහිරාවියනි! ඔබ මා හැර දමා අද
ඈතක ගොසින් අයියෝ කොහෙ සිටින වද

හදවත මොලව මොලවා පෙම් ගින්න දවා
කාලය ගෙවන මා හට දැන් දවස දිවා
ගන්නා තුරු ම ඒ ඇවිලෙන ගින්න නිවා
මා හට එපා විය මගේ දිවිය පවා

සිටියත් ලොවේ කොතරම් ලස්සණ ගෑනු
මට නැහැ වටින්නේ එක ගෙඩියක් ලූනු
සොඳුරියේ මගේ පෙම් කුසුමෙහි ඇති රේණු
ඔබටයි සදා ඔබටයි මදහස පානු

*සුපුන් විජේතුංග*
*ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය*

# විමලරත්න කුමාරගම



පාතදුම්බර පලිස්පත්තු බස්නාහිර කෝරලයේ නකල්ස් කඳු වැටියේ සිට ගලා බසිනාහුළු ගඟට මායිම් ව පිහිටි නාරම්පනාව නම් සුන්දර ගම්මානයේ දී විමලරත්න කුමාරගම උපත ලැබුවේ 1919 ජනවාරි 18 වන දා ය. ස්වභාව සෞන්දර්යෙන් අනූන උපන් ගම් පියසෙ සමඟ ඔහු ගේ ජීවිතය ඇඩි ලෙස බැඳී තිබුණි. වරෙක ඔහු එය සටහන් කළේ මෙසේ ය.

නිතර ම නිවෙස් වූ හුදු වාසනාවට
කඳු වැටිවලින් මා දිනූ ගම උනා වට
මෙලෙසින් ඔබෙන් පිට පියවර ගෙනා වට
මා උරුමයකි මගෙ නාරම්පනාවට

රජයේ මුල් ගුරුවරයෙකු වූ ඔහු ගේ පියා පුංචි බණ්ඩාර කුමාරගම වූ අතර මව කේ. එච්. බණ්ඩාර මැණිකේ නම් වූවා ය. සොයුරු සොයුරියන් හත් දෙනෙකු ගෙන් සමන්විත පවුලක දෙවැන්නා වූ කුමාරගම මුලින් ම අධ්‍යාපනය ලැබුවේ මහනුවර මඩොල් කැලේ වේරපිටිය විද්‍යාලයෙනි. පසු ව තෙල්දෙණිය ද්විභාෂා විද්‍යාලය, කටුගස්තොට ශ්‍රී රාහුල විද්‍යාලය, මහනුවර ධර්මරාජ විද්‍යාලයෙන් ද අධ්‍යාපනය ලැබුවේ ය.

1935 දී ලන්ඩන් මැට්රික් විභාගය සමත් වූ කුමාරගම රජයේ ලිපිකාර පදවියක් ලබාගෙන ප්‍රථමයෙන් රාජ්‍ය සේවය අරම්භ කරන ලද්දේ අනුරාධපුර කච්චේරියෙනි. 1942 දී උසස් වීමක් ලබා දෙමළ හත්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියෙකු වශයෙන් පත් වීමක් ලැබෙන විට ඔහු විසිතුන් හැවිරිදි වියේ පසු විය. එතැන් පටන් ආණමඩුව, නුවරඑළියේ උඩහේවාහැට රත්නපුර කුකුළු කෝරලයේ, කලවාන, බින්තැන්න, හත්පත්තුවේ, කැගල්ල පරණකුරු කෝරලයේ ගරුණෑගල වන්නි හත්පත්තුවේ, කොත්මලේ ආදි නැලෑබද දුෂ්කර ප්‍රදේශවල රාජකාරි කටයුතු කළේ ය.

මෙවැනි දුෂ්කර ප්‍රදේශවල සේවය කිරීමට ලැබීම ඔහු මහත් වරමක් කොටගත්තේ ය. මියෙන තුරු ම තනිකඩව විසූ හෙතෙම තම ජීවිතය බෙදා හදාගත්තේ ගැමි දිවිය හා සොබාදහම සමඟ ය. ඔහු බෙහෝ විට තම කාව්‍යකරණයට අනුගත කරගත්තේ ගැමියන් ගේ දුක්ඛිත ජීවිතය ඔවුන් ගේ ආධ්‍යාත්මික පරිසරය හා චර්යාරටා ය.

සෙවණැලි අවදි නොමවන වැව් ඉවුරුකොනේ
කාලය විසින් හැරුව නුග ගසක බෙනේ
මළ කා කළුව ගිය ආයුධ කැබලි පෙනේ
දෙවියෙක් නැත ද මෙහි බලයක් තිබෙනුපෙනේ

නුගත් ගැමියන් වෙනුවෙන් උපන් දයාව සහ දේව විශ්වාසයක් නොමැති ව ඔවුන්ට අන් සරණක් නොමැති බව 'අයියනායක' නමැති කවි පෙළෙන් ඔහු චිත්‍රණය කරන්නේ එසේ මහත් වූ සංයත ස්වරයෙනි. හේරත් හාමි, සුන්දර හාමි, ආරච්චිල ආදි ගැමි චරිත හරහා ගැමි දිවියේ අව්‍යාජත්වය සේ ම දුබලකම්, නොපනත්කම් සහ නිර්දය පරිසරය විසින් ගොඩනඟන ලද උදාසීනත්වය ගතානුගතිකත්වයෙන් තොර ව දකියි.

නැගණිය මළ විට දී දොස්තර සමඟ ගොසින්
ඇගෙ කය කපන ලදි හේරත් හාමි විසින්
බැන්නත් ඔහුට මේ ගැන ගම පුරුදු බසින්
ඔහු හට වැඩක් නැත ලොව ඇති රිහිරි මසින්

කුමාරගම කවි පොතේ පහක් රචනා කරන ලද මුත් ඔහු ගේ ජීවත කාලය තුළ පළ වූයේ සංවේග වේදනා (1940) හපුමලී (1946) යන කවි පොත් දෙක පමණි. නිල් සීනය (1941), ඔරුව (1942), හුරතල්ලු (1961) යන කාව්‍ය ග්‍රන්ථ පසු ව ඒ අතරට එක්විය. මීට අමතර ව නින්දට යෑමට ප්‍රථම කවියක් හෝ දෙකක් දින පොතෙහි සටහන් කිරීම ඔහු පුරුද්දක් කරගෙන සිටියේ ය. ඒ 1962 වර්ෂයේ දී ය. ඔහු එය හැඳින්වූයේ 'පිස්සෙකු ගේ දිනපොත' නමිනි.

අවසන් වරට සේවය කරමින් සිටි නුවරඑළියේ සංගිලි පාලමේ දී ඔහු රෝගාතුර විය. ඉන් සුවයක් නොලැබ 1962 දෙසැම්බර් 30 වන දා මහනුවර රජයේ රෝහලේ දී අවසන් හුස්ම හෙළී ය. ලාංකීය කාව්‍ය ක්ෂේත්‍රය ඒකාලෝක කළ ඔහු ගේ කාව්‍ය ජීවිතය අවුරුදු විසි හතක් පුරා විහිදී ගිය ද ඔහු ගේ ජීවිත කාලය සීමා වූයේ අවුරුදු හතලිස් තුනක් වැනි කෙටි කාලයකට පමණි.

*උදේනි සිරිමාන්න*

කඩමල්ලක් කියා අවමන් ගැරහුම් කරපු
ව්‍යවස්ථාව කොච්චර නං බලගතු ද?
හීනෙන් ජේ. ආර්. ඇවිදින් අහනකොට
දුන් පිළිතුරයි මේ ජනපතිනිය එයට

කදිරත්, දිමුත් පත්කරමින් ඇමැති ලෙස
මා කළ විකුම් ආරංචි ද ඔබට අනේ
පිං දී දානයක් වත් දෙන්නට ඕනෑ ය
රන් කඳ කියනව ද දෙවියනි ඔබ කොහිද?

**සුංගිරාල**



ඉරිදා දිවයින පුවත්පත බැලීමට අවස්ථාව නොලත් ලන්ඩනයන් වෙනුවෙන් අපි පෙබරවාරි 15 දා දිවයිනේ සුංගිරාල ගේ කවි රසය බෙදාගැනීම සඳහා මෙහි පල කර සිටින්නෙමු.

## වසන්තයේ වියෝව

රන්වන් හිරු රශ්මි
තුරු වදුලු විනිවිද
සුදු මුදු දලු මෙන් ම
කොළ මල් පල ගෙනෙන
අසිරිමත් රස පිරුණ
පල දරන්නට බැරි
තුරු පහත් වී හිඳ
හෙමිහිට බිම බලන

ඔබටත් මටත්
ගහටත් හොරෙන්
පොකුරු වී පල එල්ලෙන
චමත්කාර පරිසරය
සාඩම්බර බැලුම් හෙළන
කුරුල්ලනි තොපට පමණ ද
රසබර පල ඉදෙන

නිල් අහසට අඳුර විදා
හිරු රශ්මි දුර ගොසිනි
දැන් ඉතින් කොහොමටත්
මෙම සිරිය නොවිසිරී
රකින්නට නො හැකි ම ය!

කළු සළුවෙන් වැසෙන
පරිසරය වැලපේ
කවුරුත් සිතු ලෙස
ගස් වැල් ගියා මැල වී
දේදුනු පැහැය ගෙන
මනාලිය සේ සැරසුණ

මල් පෙති සැලී හැළුණි
කොළ හැකිළී ගිලිහී
එකිනෙක බිම පතිත වී
සිහින් පවනින් තිගැස්සී
පාවී පාවී ගොසින්
යළි යළිත් මිහිකතම සිපගනී

සුවිසාල ගහ කොළ
සාදරෙන් වැළඳගෙන
සෙනෙහෙබර හැඟීමෙන්
යළි එළි දකින්නට
මෙහෙවරක යෙදෙන්නේ
මවක මෙනි දයාබර
මිහිකත තිරසාර

මගෙ මල් මට දෙන්න
සොබා දහමට කොඳුරන
දැත් අහසට විදා
ඉල්ලා යදින්නී
වැහැරී දිරා ගිය
අසරණ මැහැල්ලක සේ
තුරු වදුලු දර ඉපල් වී
නිසලව ඉකිබිඳී!

කුරුල්ලනේ ගී ගොළු වී
සා මුවනේ කොහි සැඟවී
කුරා කුහුඹු නෙත නොගැටී
සීතල ගුළි හිම කැටි වී
සිරුවෙන් ගල් ගැසී
මේ බලා ඉන්නේ
එනතුරු ය
හිමරු කුමරු
පැහැසර ව සැරසී!

*සුමනා අදිකාරි - එන්ෆීල්ඩ්*

## විදෙස් ගත සිතිවිලි

සිප් සතර ලබන්නට
කොතෙක් දුර ගියෙද මං
ඔබ බිරිඳ වන්නට
ගෙවූ දුර කොතෙක් දෝ

බැටළුවන් සැරිසරන
ඒ දසුන් මනහරයි
සීත කල ආ විට දී
ඔවුන් කොයි ගියේ දෝ

බීර පබ් හල තුළින්
මත් සුවඳ විහිද යයි
මීවිතෙන් පුබුදු වූ
ඒ දනා කවුරු දෝ

තෙවන ලොව අප රටේ
හන්දියේ කඩ පිලේ
කසිප්පුව හංගගෙන
කට ගැවෙ කවුරු දෝ

ලන්ඩනයෙ මඟ දෙපස
සන්නිවේදන තුළින්
ගණිකාව හමු වූ විට
ඒඩ්ස් තිළිණය පිදේ

නීති පද්ධති උගන්නද
අත හරිමින් රන් පවුම්
ලක්බිමේ රුපියලේ
අගය බලනා ලෙසේ

දෙමාපිය නෑසියන්
සතුරු මිතුරන් සැවොම
යළි නැවත සමුවන්ට
පා තැබුණි මවුබිමට

කාලය ගත වී ඇත්තේ
කළ වැඩි දෙයකුත් නැත්තේ
දෙදෙනා තිදෙනෙක් වෙයි දෝ
අනාගතය සරු වෙයි දෝ
නැවත විදෙස් ගත වෙයි දෝ

*විපුලි ගුණසේකර - ලන්ඩනය*

ලන්ඩනයට එන්නට පෙර
ශ්‍රී ලංකාවේ දී ලියවුණු කවියකි